# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2107/53 – 2019 ජනවාරි 25 වැනි සිකුරාදා – 2019.01.25**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/07/10/2012.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

අංක 2086/41 දරන හා 2018.08.31 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ* ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශවයක් වශයෙන් කොළඹ 03, ඇලෝයි මාවත, අංක 06 හි පිහිටි ලංකා වතු සේවා සංගමය (අනුර වසන්ත ආදිහෙට්ටි මයා. වෙනුවෙන්) හා අනෙක් පාර්ශවය වශයෙන් කහදූව, රැකඩහේන හි පිහිටි රැකඩහේන ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක ඒ 3590 දරන හා 2018.07.19 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් රැකඩහේන ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක ඒ 3590 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මකවීම 2019.08.31 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 දෙසැම්බර් මස 21 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 29328 – 11 (2019/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පළමුවන උපලේඛනය

**'අ' ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : වතු අධිකාරි,
රැකඩහේන ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
රැකඩහේන,
කහදූව.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2018.08.31 දිනැති අංක 2086/41 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ ද, ලංකා වතු සේවා සංගමය සහ රැකඩහේන ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් බැඳී සිටින්නාවූ ද 2018.07.19 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පිටපත - (අනෙක් පාර්ශවය)
ලංකා වතු සේවා සංගමය,
අංක 06,
ඇලෝයි මාවත,
කොළඹ 03.

(1) ප්‍රතික්ෂේප කරන පාර්ශවය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශවයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්ති බලන්න.)

(2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශවයක්, සේවායෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශවයක්, සේවායෝජකයෙකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුය.

02 – 392

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.